සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | MF/WBB/Asw.work sh./2023 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023.10.02 |

ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>අභියාචනා / විරෝධතා කමිටු පැවැත්වීමට අදාළ මාර්ගෝපදේශය</u>

අභියාචනා හා විරෝධතා කමිටු පැවැත්වීමේදී මතුවන ප්‍රායෝගික ගැටලු සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් 2023.09.15 දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී පැවැත් වූ වැඩමුළුවක් පවත්වන ලදී. එහිදී, පැමිණි සියලු දෙනාගේ සහභාගීත්වයෙන් සකස්කළ මාර්ගෝපදේශය මේ සමඟ ඔබ වෙත එවමි.
උපයෝගී අභියාචනා / විරෝධතා කමිටු පැවැත්වීමට එම මාර්ගෝපදේශ අදාළ කරගන්නා මෙන් කාරුණිකව දන්වමි.

ආර්.පී.ආර්. රාජපක්ෂ
අතිරේක කොමසාරිස් (මෙහෙයුම්)
කොමසාරිස් වෙනුවට

පිටපත - සියලුම දිස්ත්‍රික් ලේකම්වරු -දැ.ගැ.පි.

කාර්යාලය / அலுவலகம் / Office — Tel: 009411-2151481, 009411-2484600/4117; Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail — welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website — www.wbb.gov.lk

## 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනත
## අභියාචනා / විරෝධතා කමිටු පැවැත්වීමට අදාළ මාර්ගෝපදේශයක් සකස් කිරීම

**1. අභියාචනා කමිටුවල සංයුතිය.**

2022.10.20 දින නිකුත් කර ඇති 2302/23 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ IV කොටසේ සඳහන් නියෝගවලට පටහැනිව සමහර දිස්ත්‍රික්කවල අභියාචනා කමිටු සාමාජිකයන් පත්කර ඇති අවස්ථා ඇති බව පෙනී යන බැවින්, එය නිවැරදි විය යුතුද යන්න පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරුන්ට උපදෙස් නිකුත් කිරීම.

i. සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් අභියාචනා කමිටුවල සභාපතිවරුන් ලෙස පත් කර තිබීම. (2 stages approval)

ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් අභියාචනා කමිටු සාමාජිකයින් ලෙස පත් කර තිබීම.

iii. අභියාචනා / විරෝධතා කමිටුවල සාමාජිකයන් සඳහා විධිමත් පත්වීම් ලිපියක් ලබා දීම.

**2. ගණනය කිරීමේ ක්‍රමය.**

සුබසාධක ප්‍රතිලාභ ලබාදීම සඳහා සලකා බලන ලද දර්ශකවලට අදාළව සමීක්ෂණයේදී ලබාදුන් තොරතුරු සංශෝධනය කරන ලෙස ඉල්ලා අභියාචනා ඉදිරිපත් කර ඇති පුද්ගලයින්ගේ අභියාචනා කමිටුවලදී තොරතුරු තහවුරු කරගෙන තීරණ ගැනීම අභියාචනා කමිටුව විසින් සිදුකල යුතුය. එහිදී අවශ්‍ය යැයි හැගෙන්නේ නම් තීරණ ගැනීමේ පහසුව සඳහා පහත ලේඛන එකක් හෝ සියල්ලම ලබා ගැනීමේ හැකියාව සහ අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් අභියාචකයන් කමිටුව වෙත කැඳවීම කමිටු තීරණ පරිදි සිදුකල හැක. ලේඛණ මඟින් තහවුරු කල නොහැකි කරුණු අභියචනා කමිටුව වෙත දිවුරුම් ප්‍රකාශයක් මඟින් ලබාගත හැකිය.

මෙහිදී ඇතැම් ලකුණු ලැබීමේ දර්ශකයන්හිදී පවුලේ එක් සාමාජිකයෙකුගේ තොරතුරු වුවද සම්පූර්ණ ලකුණු ලැබීමට ප්‍රමාණවත් වේ (අධ්‍යාපන හා සෞඛ්‍ය දර්ශක). නමුත් මෙම දත්ත ඉදිරියේදී අනෙකුත් සමාජ ප්‍රතිලාභ ගෙවීම් සඳහාද අදාල කරගැනීමට නියමිත බැවින් අභියාචනා කමිටුව වෙත සංශෝධනය සඳහා ඉදිරිපත් වන සියලු කරුණු සලකා බලන ලෙස වැඩිදුරටත් සඳහන් කරමි.
(උදා : අභියාචනා සඳහා අධ්‍යාපන මට්ටම යන දර්ශකය යටතේ සාමාන්‍ය පෙල අසමත් දරුවන් එක් අයෙකුට වැඩි ප්‍රමාණයක් සිටිනම් ඒ සියලු දෙනාගේ තොරතුරු ඇතුලත් කරන්න)

| දර්ශකය | කරුණු තහවුරු කර ගැනීමට අදාළ කර ගත යුතු ලේඛන / තොරතුරු |
|---|---|
| **1. අධ්‍යාපනය** | |
| i. පවුලේ සාමාජිකයින්ගේ අධ්‍යාපන මට්ටම. | - ශිෂ්‍ය කාර්ය දර්ශකය.<br>- අ.පො.ස. සා/පෙළ , අ.පො.ස. උ/පෙළ අධ්‍යාපන සහතික. |
| ii. වයස 5-16 අතර පාසල් නොයන ළමුන් සංඛ්‍යාව. | - දරුවාගේ උප්පැන්න සහතිකය.<br>- ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී / ග්‍රාම නිලධාරී වාර්ථාව. |
| **2. සෞඛ්‍ය** | |
| i. දීර්ඝකාලීන නිදන්ගත රෝග වලින් පෙලෙන පවුලේ සාමාජිකයන්. | - අභියාචනා දිනයේ සිට පසුගිය වසරක කාලය තුළ රජයේ රෝහලක සායනවලට සහභාගී වී ඇති බවට තහවුරු කර ගැනීමට සායනික වාර්තා. |
| ii. ආබාධ සහිත පවුලේ සාමාජිකයන්. | - ආබාධිත බව තහවුරු කරන වෛද්‍ය වාර්ථාව.<br>- ආබාධිත දීමනා ගෙවීම් ලේඛණය. |
| **3. ආර්ථික මට්ටම** | |
| i. මාසික ඒක පුද්ගල වියදම. (රු. 14000) | - පවුලේ වියදම සනාථ කරන දිවිරුම් ප්‍රකාශයක්. |
| ii. මාසික ඒක පුද්ගල ආදායම. (රු. 13800) | - ග්‍රාම නිලධාරී මඟින් ලබා ගන්නා ආදායම් වාර්තාව.<br>- රජයේ හෝ පුද්ගලික අංශයේ සේවකයෙක් නම් සහතික කරන ලද වැටුප් වාර්ථාවක්. (දළ වැටුප සැළකිය යුතුය) |
| iii. මසකට ඒකක 60ට අඩු විදුලි පරිභෝජනය. | - අනුයාත මාස 03ක විදුලි බිල්පත් |
| **4. වත්කම්** | |
| i. වාසය කරන නිවස හා ඉඩම පවුලේ සාමාජිකයෙකුට හිමිව නොතිබීම. | - බලපත්‍රයේ / දීමනා පත්‍රයේ / සින්නක්කර ඔප්පුවේ පිටපතක්.<br>- නීත්‍යානුකූල ලියවිල්ලක් නොමැති නම් ඉඩමේ භුක්තිය සනාථ කරන ග්‍රාම නිලධාරී වාර්ථාව. පදිංචි ඉඩමට නීත්‍යානුකූල |

| | |
|---|---|
| | ලියවිල්ලක් නොමැති වුවද පවුලේ සාමාජිකයන් නිරවුල්ව භුක්ති විඳින බවට ග්‍රාම නිලධාරී සනාථ කරන්නේ නම් ඉඩමක හිමිකාරීත්වය ඇතැයි සැලකීම.<br>- නීත්‍යානුකූල ලියවිල්ලක් නොමැති රජයේ ඉඩමක භුක්තිය පවතින බවට ග්‍රාම නිලධාරී වාර්තාවක් මඟින් සනාථ කරන්නේ නම් ඉඩමක හිමිකාරීත්වය ඇතැයි සැලකීම<br>- කුලියට / බද්දට සිටින්නේ නම් අදාල ගිවිසුමේ පිටපතක් |
| ii. පවුලේ සාමාජිකයෙකුට වෙනත් නිවසක් හෝ ගොඩනැගිල්ලක අයිතිය නොතිබීම. | - අභියාචක වෙතින් ලබා ගන්නා දිව්රුම් ප්‍රකාශයක්. |
| iii. පවුලට අවම වශයෙන් අක්කර 0.5ක වගා කල හැකි ගොඩ ඉඩමක් නොතිබීම. | - බලපත්‍රයේ / දීමනා පත්‍රයේ / සින්නක්කර ඔප්පුවේ පිටපතක්.<br>- නීත්‍යානුකූල ලියවිල්ලක් නොමැති පෞද්ගලික / රජයේ ඉඩමක් පවතී නම් අදාළ ඉඩම වගා කර නිරවුල්ව භුක්ති විඳින බවට ග්‍රාම නිලධාරී වාර්තාව.<br>- බලපත්‍රයේ / දීමනා පත්‍රයේ / සින්නක්කර ඔප්පුවේ පිටපතක්. |
| iv. පවුලට අවම වශයෙන් අක්කර එකක වගා කල හැකි කුඹුරු ඉඩමක් නොතිබීම. | - ගොවිජන සේවා දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යන කුඹුරු නාමලේඛනය / පොහොර නාම ලේඛණය. |
| v. ගමනාගමනයට අදාළ එක් වාහනයක්වත් නොතිබීම. | - වාහනයේ ලියාපදිංචි සහතිකය.<br>- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය.<br>- වාහන ආදායම් බලපත්‍ර ලබාගැනීම පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීම<br>- වාහනයට තම හිමිකම් තිබුනද (පවුලේ සාමාජියෙකුගේ නමට ලියාපදිංචිව නොතිබෙන අවස්ථාවක) එය භාවිතා නොකරන බවට දිව්රුම් ප්‍රකාශයක්. |
| vi. අවම වශයෙන් ආර්ථික ක්‍රියාකාරකමකට අදාළ එක් වත්කමක්වත් නොතිබීම. | - අදාළ වත්කම් මිළදී ගැනීමට අදාළ Invoice මුල් පිටපත.<br>- අදාළ වත්කම ආර්ථික කටයුත්තකට භාවිතා නොකරන බවට දිව්රුම් ප්‍රකාශයක්. (වත්කම පවුලේ සාමාජිකයෙකුගේ නමට නොමැති අවස්ථාවක) |
| vii. අවම වශයෙන් ජීවනෝපායට අදාළ එක් වත්කමක්වත් නොතිබීම. | - පශු වෛද්‍ය / ක්ෂේත්‍ර වාර්තාවක් මගින් තහවුරු කර ගැනීම. |
| 5. <u>නිවාස තත්වය</u><br>i. ලැයිම් කාමර / පේළි නිවාස / මුඩුක්කු / මඩුවල ජීවත් වීම හෝ වෙනත්. | - සමීක්ෂණයේදී ලබා ගන්නා ඡායාරූප මඟින් / කමිටු නිරීක්ෂණ හෝ ක්ෂේත්‍ර වාර්තාවක් මඟින් තහවුරු කර ගැනීම. |
| ii. ජීවත් වීමට ස්ථිර බිත්ති, ස්ථිර වහලයක් සහිත නිවාසයක් නොමැති වීම. | - සමීක්ෂණයේදී ලබා ගන්නා ඡායාරූප මඟින් / කමිටු නිරීක්ෂණ හෝ ක්ෂේත්‍ර වාර්තාවක් මඟින් තහවුරු කර ගැනීම. |
| iii. සම්පූර්ණ බිම් ප්‍රමාණය වර්ග අඩි 500ට අඩු වීම. | - කමිටු නිරීක්ෂණ හෝ ක්ෂේත්‍ර වාර්තාවක් මඟින් |
| iv. පානීය ජලය ලබා ගැනීමේ හැකියාවක් නොමැති වීම. | - කමිටු නිරීක්ෂණ හෝ ක්ෂේත්‍ර වාර්තාවක් මඟින් |
| v. අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම. | - කමිටු නිරීක්ෂණ හෝ ක්ෂේත්‍ර වාර්තාවක් මඟින් |
| vi. විදුලි බලය නොමැති වීම. | - කමිටු නිරීක්ෂණ හෝ ක්ෂේත්‍ර වාර්තාවක් මඟින් / ආර්ථික මට්ටම යන දර්ශකය යටතේ විදුලි බිල සම්බන්ධයෙන් ලබා දී ඇති තොරතුරු සමඟ ගැලපිය යුතුය |
| 6. <u>පවුලේ ජන විකාශය</u><br>i. යැපීම් අනුපාතය. | නිවැරදි උපන් දිනය සඳහන් කිරීම ප්‍රමාණවත් වේ.<br>- උප්පැන්න සහතිකය / ජාතික හැඳුනුම්පත මඟින්. |

| | |
|---|---|
| | - ඡන්ද නාම ලේඛණය මඟින්. |
| ii. මව හෝ පියා පමණක් සිටින පවුලක් වීම. | - ඡන්ද නාම ලේඛණය මඟින්.<br>- මරණ සහතිකය (කලත්‍රයාගේ) / දික්කසාද සහතිකය.<br>- ග්‍රාම නිලධාරි වාර්ථාව / පොලිස් පැමිණිල්ල (කලත්‍රයාගෙන් වෙන්ව ජීවත් වන බවට) |

<u>පොදු කරුණු</u>

- අභියාචනා / විරෝධතා කමිටු සඳහා පුද්ගලයන් කැඳවීමට යොමු කරන කෙටි පණිවිඩය සිංහල / දෙමළ භාෂා දෙකෙන්ම යැවීමට පහසුකම් සලසා දීම හා පරීක්ෂණයට කැඳවන දිනය, වේලාව හා රැගෙන ආ යුතු ලේඛන අදාල පණිවිඩයේ සටහන් කිරීමට පහසුකම් ලබා දීම.

- එක් එක් දර්ශකය අනුව අභියාචනා පද්ධතිය මඟින් වෙන් කිරීමේදී (sort) අදාල මේ වන විට පෙන්නුම් කරන කාණ්ඩ දෙකටද නිවැරදිව වෙන් කර නොමැති බව සනාථ වේ. එබැවින් ලැබී ඇති අභියාචනා අදාළ දර්ශක අනුව නිවැරදිව කාණ්ඩ 08කට වෙන් කිරීම.

මෙම තොරතුරු දත්ත පද්ධතිය තුල වෙන්වෙන්ව පරීක්ෂා කිරීමට අවස්ථාව ලබාදීම
- ආදායම හා වියදම වෙනස් කල, ලකුණු ගණන වෙනස් වන / නොවන
- විදුලි ඒකක ගණන වෙනස් කල, ලකුණු වෙනස් වන / නොවන
- ආදායම, වියදම හා විදුලි ඒකක ගණන වෙනස් කල, ලකුණු වෙනස් වන / නොවන
- මීට අමතරව සිදුකර ඇති වෙනස්කම් මත, ලකුණු වෙනස් වන / නොවන

- අභියාචනය ඉදිරිපත් කිරීමේදී එකදු දර්ශකයක් හෝ සංශෝධනය විය යුතු බවට සඳහන් කර නොමැති අභියාචකයන් අභියාචනා පරීක්ෂණ සඳහා කැඳවීමකින් තොරව අභියාචනා කමිටුව රැස්වී අභියාචනය ප්‍රතික්ෂේප කිරීම.

- අභියාචනා / විරෝධතා පරීක්ෂණවල තීරණ කෙටි පණිවිඩයක් මගින් (SMS) සිංහල හා දෙමළ භාෂා දෙකෙන්ම විධිමත්ව දැනුම්දීමට පහසුකම් පද්ධතිය තුලින් ලබා දීම.